20/07/2010 - ලංකාදීප

**උපායශීලීව මෙහෙයවිය යුතු ජාත්‍යන්තර සබඳතා - මිලින්ද මොරගොඩ**

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මුතු ඇටයයි. මෙවැනි විරුදාවලියක් ලබන්නට ලංකාව සමත්වූයේ මෙරට ඇති සොබාවික මුදු ගුණය හා අපූරු සෞන්දර්යාත්මක දූපත් ස්වභාවයයි. දෙදහස් පන්සිය වසරකට වැඩි ලිඛිත ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාව කුඩා නමුත් හැමවිටම ජගත් ප්‍රජාවගේ ආකර්ශනයට ලක්ව ඇත.

වර්තමාන ලෝක ජනගහනය බිලියන 6.7 ක් පමණ වන අතර එය වසර 2050 වන විට බිලියන නමයක් පමණ වනු ඇතැයි සැලකේ. මෙරට ජනගහනය මිලියන විස්සකි. චීනය ඉන්දියාව වැනි රටවල් ජනගහනය අතින් යෝධයන්ය. ලෝක ආර්ථිකය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 69 ක් වන අතර ආර්ථික ශක්තිය අනුව ලෝකයේ දැවැන්තයන් අතර ශ්‍රී ලංකාවට හිමිව ඇත්තේ හැට හත්වන ස්ථානයයි. ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 14 බැගින් ආර්ථික ශක්තියක් ඇති යුරෝපීය ප්‍රජාව හා ඇමරිකාව එහි මුදුනේ සිටී. චීනය හා ජපානය පිළිවෙලින් තුන්වැනි හා හතරවැනි ස්ථාන ගෙන ඇත්තේ ට්‍රිලියන අට බැගින් ආර්ථිකයක් ඇති රටවල් වශයෙනි. ට්‍රිලියන තුනක ආර්ථිකයක් හිමි අසල්වැසි ඉන්දියාව ලෝක බලවතුන් අතර පස්වැනි ස්ථානයේ සිටී. ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඇමරිකානු ඩොලර් බිලියන 41 කි. ලෝක මානව සංවර්ධන වාර්තාව අනුව ශ්‍රී ලංකාව පසුවන්නේ ලොව රටවල් 182 ක් අතර 102 වැනි ස්ථානයේ බව මහ බැංකුවේ අලුත්ම වාර්තාව ද පෙන්වා දෙයි.

ස්ටොක්හොම් ජාත්‍යන්තර සාම පර්යේෂණ දත්ත අනුව ලෝකයේ ආරක්ෂක වියදම් සඳහා වැඩිම මුදලක් වැය කරන රට ඇමරිකාවයි. එරට ආරක්ෂක වියදම ඇමරිකානු ඩොලර් බිලියන 663කි. චීනය බිලියන 98 ක්, බ්‍රිතාන්‍ය බිලියන 69 ක්, ප්‍රංශය බිලියන බිලියන 67 ක් හා ඉන්දියාව බිලියන 36 ක් ආරක්ෂක වියදම් වශයෙන් වසරකට වැය කරන අතර ලංකාවේ ආරක්ෂක වැය ඇමරිකානු ඩොලර් බිලියන 1.5 කි.

කුඩා රටක්, කුඩා ආර්ථිකයක් ඇති සමාජයක් ජගත් ප්‍රජාව ඉදිරියේ ධෛර්යවත් ලෙස අභිමානයෙන් නැගී සිටින්නට සමත්වීම සුවිශේෂී අවස්ථාවකි. එහි සම්පූර්ණ ගෞරවය අත්පත් විය යුත්තේ මහජනතාවට සහ රට ඉදිරියට ගෙන ගිය නායකයන්ටය. කොතරම් අපහසුතා හා බාධක මැද වුවත් තම අනන්‍යතාවය ආරක්ෂා කරගනිමින් දක්ෂ ලෙස ලෝකයේ නොයෙකුත් රටවල් සමග තරගකරන්නට අප සමත්ව ඇත. ජාත්‍යන්තරයේ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සම්බන්ධයෙන් වැදගත් වන්නේ විදේශ සම්බන්ධතා හා එහි උපායශීලී බවයි.

රාජධානි යුගයේ දී පවා ලංකාව ජගත් ප්‍රජාව සමග සම්බන්ධතා පවත්වා තිබේ. ඉන්දියාව, චීනය ඇතුලු පෙරදිග රටවල් සමග පැවති වෙළඳ හා ධර්ම දූත සම්බන්ධතා ඒ අතරින් කැපී පෙනෙයි. අනුරාධපුරය වැනි වෙළඳ නගර හා නැගෙනහිර ප්‍රදේශයේ ස්වභාවික වරාය මගින් රට තුළට පැමිණ ඇති වෙළඳුන් ලාංකික සමාජය සමග ගෞරවාන්විත අන්දමට ගනු දෙනු කර තිබේ. බාහිර ආක්‍රමණ පැමිණි අවස්ථාවේ දී ශක්තිය, ධෛර්යයට අමතරව උපාය පාවිච්චි කරන ලද බවට සාක්ෂි ඇත. විජාතික බලවේග හා ඔවුන්ගේ ආකල්ප හඳුනාගෙන සාර්ථකව මුහුණ දෙන්නට හැකියාවක් ශ්‍රී ලංකාව පාලනය කළ රජවරුන්ට තිබී ඇත. පෘතුගීසීන් පැමිණි විට ගිරි දුර්ග මැදින් දීර්ඝ ගමනකින් රජු හමුවට ගෙන යාමත්, දීර්ඝ කාලයක් සටන් කළත් සම්පූර්ණයෙන්ම ලංකාව යටත් කර ගන්නට අපහසුවීමත් පෙන්නුම් කරන්නේ උපායශීලීත්වයයි. පෘතුගීසින් යටපත් කරන්නට, ලන්දේසින්, ලන්දේසීන්ගේ බලය පාලනය කරන්නට කෙටි කාලයකට ප්‍රංශයේ හා පසුව ඉංග්‍රීසීන්ගේ සහාය ලබා ගෙන ඇත. මෙම කාර්ය භාරය වෙනුවෙන් ඇතැම්විට දූත මෙහෙවරක යෙදී ඇත්තේ මුස්ලිම් වෙළඳ ප්‍රජාව බව ඉතිහාසය කියයි. ලංකාවේ රජවරුන් පවා විදේශ බලවේග පාලනයට යෙදූ උපක්‍රම හා උපායශ්‍රීලීත්වය මෙයින් පැහැදිලිය. ලංකාව යටත්කර ගන්නට බටහිර අධිරාජ්‍යවාදීන්ට හැකිවූයේ සංස්කෘතික ලක්ෂණ හා අනන්‍යතාව මනාව හැදෑරීමෙන් පසු මහජනතාව එකිනෙකා කෙරෙහි බිඳවා, ගරු නාම හා තනතුරු දී තම පාර්ශවයට ගැනීමෙන් පසු පමණකි.

නිදහස ලබා ගැනීමෙන් පසු යුගයේ දී ඇමරිකාව හා සෝවියට් දේශය යන බලවත් රාජ්‍ය අතර සීතල යුද්ධය පවතින අතරතුර තම විදේශ ප්‍රතිපත්තිය සමබරව පවත්වාගෙන යන්නට ශ්‍රී ලංකාවට හැකි විය. දෙවන ලෝක යුද්ධයෙන් පසු බලවත් ජාතීන් ජපානය යුධවන්දි ගෙවිය යුතු රටක් වශයෙන් කොන් කරන විට ඒ වෙනුවෙන් වෙනස් මතයක් ඉදිරිපත් කළේ ශ්‍රී ලංකාව පමණකි. එහිදී ජේ. ආර්. ජයවර්ධන මහතා කළ ප්‍රකාශය නිසා ලෝක අවධානය වෙනස් වූ අතර ජපානය ශ්‍රී ලංකාවේ සදාකාලික මිතුරෙකු බවට පත්විය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් නොබැඳි ජාතියක් වශයෙන් පෙනී සිටිමින් ගෙන ගිය මතය වුවත් ජාත්‍යන්තර බලවේග ඉදිරියේ මෙරට අනන්‍යතාවයට ගෙන ගිය සුවිශේෂී පිලිවෙතක් බව අවබෝධ කර ගත යුතුය. කුඩා රටකට බලවත් රාජ්‍ය හමුවේ ඔවුන්ට අභියෝගයක් විය නොහැකි නමුත් උපායශ්‍රීන දුරදක්නා නුවණින් ක්‍රියාකිරීමෙන් ගෞරවයත් අවස්ථාවත් දිනා ගත හැකිය. විටින් විට ලෝකයේ ඇතිවන ආර්ථික දේශපාලන වෙනස්කම් ඉදිරියේ මෙරට රාජ්‍ය නායකයන් නොයෙකුත් තීරණ ගෙන ඇත. අභියෝග, තර්ජන හා මර්දන ඉදිරියේ අවශ්‍ය විටෙක නැමෙමින් හා තවත් අවස්ථාවක පියවරක් පිටුපසට තබමින් ක්‍රියාකිරීම හෙයින් නිරන්තරවම ශ්‍රී ලංකාව ස්වකීය අනන්‍ය ස්ථාවරය ආරක්ෂා කර ගන්නට සමත්වීම කැපීපෙනෙයි.

1971 කැරැල්ල, 83 ජුලි කලබල, 1987 දෙවැනි කැරැල්ල හා එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය අභියෝගයට ලක්වූ බැරෑරුම් අවස්ථාවන්ය. විදේශ මිතුරන්ගෙන් උදව් පැතීම මෙන්ම මානව හිමිකම්, හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ඉදිරිපත් කරමින් බලපෑම් කරන විදේශීය රටවල් සමබර කරගනිමින් අභ්‍යන්තර ප්‍රශ්න වලට මුහුණදීම බෙහෙවින් අසීරු කර්තව්‍යයකි. නොයෙකුත් ගැටලු හමුවේ වුවත් අපගේ සාර්ථකත්වයට බලපාන අන්දමට විදේශ ප්‍රතිපත්ති සකස් කර ගන්නට හැකිවී තිබෙන බව ආපසු හැරී බලනවිට පෙනෙන යථාර්ථයයි. දශක තුනක් යුධමය පරිසරයකට කොටුවී සිටි ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය හමුව ඉදිරියේ පෙනී සිටි ප්‍රතිරූපය වෙනස් එකකි. ත්‍රස්තවාදය අවසන් කර සාමය තහවුරු කරගැනීම කරා ගමන් කරන ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ දක්වන ආකල්පය සහමුලින්ම වෙනස් එකක් විය යුතුය. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දේශපාලන නායකයෙකු වශයෙන් තමන් ඇතුලු ජනතාව මුහුණ දුන් ත්‍රස්තවාදය මර්දනය කළ අතර එකී ප්‍රතිපලය ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය ජාත්‍යන්තර පරිසරය හා පසුබිම සකස් කරගන්නට සමත්විය. ත්‍රස්තවාදය තුරන්කරගැනීමේ ප්‍රමුඛ අභිලාශය පවතිනවිට විදේශ ප්‍රතිපත්තිය යම් යම් රටවල් සමග වචන හුවමාරු හා යම් ප්‍රමාණයක දරදඬුවීම සාධාරණ විය හැකිය. ජාත්‍යන්තර ප්‍රජාව එය තේරුම් ගන්නා බව ද සැකයක් නැත. නමුත් ඒ යුගය අවසන් වීමෙන් පසු තවදුරටත් එවැනි ප්‍රවේශයක් පවත්වාගෙන යාම සුදුසු නැත. ත්‍රස්තවාදය තුරන් කිරීමෙන් පසු ලාංකික සමාජය ජගත් ප්‍රජාව සමග අලුත් ගමනකට සූදානම් බව අප පෙන්විය යුතුය. ගෝලීයකරණ තුළ තනි ගමනකට ඉඩ නැත. ආර්ථිකය දියුණු කරගන්නට අවශ්‍ය ජගත් සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීම වැදගත්ය. අඳුරු කාලසීමාව අවසන්වීම සමග එකතුවී ගමනක් යාමට සූදානම් බවට ජගත් ප්‍රජාව වෙත පණිවුඩයක් නිකුත් කිරීම අවශ්‍යතාවයකි.

ඕනෑම රටක අභ්‍යන්තර දේශපාලනයක් තිබේ. තම රටේ ප්‍රශ්න හමුවේ දේශපාලන වාසි ගැනීමට විදේශීය බලවේග හා කුමන්ත්‍රණ වලට දොස් තබන සංස්කෘතිය අනෙක් රටවලටත් පොදුය. එහෙත් එහි සීමාවක් ඇත. තවත් රටකට දොස් තබා තමන්ගේ රටේ වැරදි වසා ගැනීමේ දේශපාලනය තවත් අධිරාජ්‍යවාදීන්ට යටත්ව සිටි රටවල බහුලව දක්නට ලැබෙන ලක්ෂණයකි. තම අභිමානය හා ආවේනික ක්‍රියා කිරීමේ හැකියාව ජාත්‍යන්තර ප්‍රජාව නිසා විලංගුවැටී ඇති බව පෙන්වන විට තම අභ්‍යන්තර ප්‍රශ්න විසඳා ගත නොහැකිවීමෙන් මතුවන මහජන උද්ඝෝෂණ යටපත් කරන්නට හැකිය. මෙය දේශපාන උපායකි. මෙයින් අවුරුදු කිහිපයකට කළින් රට තුළ ඇති ප්‍රශ්න වලට ජාත්‍යන්තර දේශපාලනයට දොස් තබා මහජනතාවගේ විරෝධය යම් පමණකට මැඩ පවත්වා ගැනීමට ඉඩ තිබුණි. බඩු මිළ වැඩි වන විට, ආර්ථිකය කඩා වැටෙන විට ජාත්‍යන්තරයට ඇඟිල්ල දිගු කරන දේශපාලනයක් අපට තිබුණි. එහෙත් දැන් පසුවන්නේ වේගයෙන් තොරතුරු හුවමාරුවන යුගයකය. රටක අභ්‍යන්තර සිදුවීම් තවත් රටකට රහසක්

වන්නේ පැය කිහිපයක් පමණකි. ජාත්‍යන්තර සම්බන්ධතා සම්බන්ධව සූක්ෂම හා උපායශීලීවීම එදාට වඩා වර්තමානයේ ඉතාමත් වැදගත්ය.

දැවැන්ත ආර්ථිකයක් ඇති රටවලට ලංකාව සමග සම්බන්ධකම් අත්හරින්නට සිදුවීම විශාල දෙයක් නොවේ. ලංකාවේ සහයෝගය හෝ වෙළඳ භාණ්ඩ නැතිව පවතින්නට මේ බලවත් රටවලට හැකියාව තිබේ. එහෙත් මේ රටවල සහයෝගය හා වෙළඳපොළ රහිතව අපට සංවර්ධනය කරා යාම අපහසුය. නැගෙනහිර රටවල ශක්තියෙන් ලෝකය පවතින බව හා ලෝක ආර්ථිකය දියුණුවෙන්නේ නැගෙනහිර හෙයින් බව ප්‍රකාශ කරන නමුත් බටහිර සම්පූර්ණයෙන් අමතක කළ නොහැක. ප්‍රබල රටවල් මේ යථාර්ථය දනී. චීනය ආර්ථික අතින් ඉහලින් සිටිය ද බටහිර සමග අමනාපයක් නැත. ආර්ථික වර්ධනය සමග චීනයේ ඇති අතිරික්ත විදේශ මුදල් ඇමරිකාවේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරයි. එකිනෙකට එරෙහිව නැගී සිටින බව පෙනෙන නමුත් ආර්ථික අතින් බැඳෙන මෙම සංකල්පය දැන් ''චිමැරිකා'' ලෙස ආර්ථික විශ්ලේෂකයෝ හඳුන්වති. මේ ආයෝජන අනුව ඇමරිකානු ආර්ථිකය අර්බුදයකට ලක්වුවහොත් චීනය ද අර්බුදයට ලක්වනු ඇත. එහෙත් දේශපාලන හා එකිනෙකා අභිබවා යන්නට දරන ආරක්ෂක උපක්‍රම තුළ වුවත් ආර්ථික සබඳතා නිදහසේ වැඩෙන බවට මෙය හොඳ උදාහරණයකි. ලෝකය තුළ තනි ගමනක් පවත්වාගත නොහැකිය. වෙනස්වෙමින් පවතින ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන ධාරාව තුළ ශ්‍රී ලංකාව ද කොටස්කරුවෙකු විය යුතුය. එය කළහැක්කේ කෙසේද? පළමුවෙන් ජාත්‍යන්තර දේශපාලනය නිවැරදිව අවබෝධකර ගත යුතුය.

මාධ්‍ය භාවිතාව හා තොරතුරු හුවමාරුව දියුණු මේ යුගයේ රටක තොරතුරු තවත් රටකට වේගයෙන් ව්‍යාප්තවන අතර ඒ අනුව එම රටවල මහජනතාව හා මහජන සංවිධාන රාජ්‍ය පාලකයන්ට බලපෑම් කරයි. ඉන්ටනෙට් භාවිතාකර තොරතුරු දැන්ගන්නා තරුණ පරම්පරාව වෙළඳපොලේදී යම් භාණ්ඩයක් මිලදී ගන්නා විට පවා හැසිරෙන්නේ මෙම ආකල්ප ඇතිවය. තමන්ගෙන් අයකරගන්නා බදු සාධාරණ හා විනිවිද පෙනෙන අන්දමට වැය කරනලෙස ඔවුන් කරන ඉල්ලීම් මෙකී රටවලට අත්හැර දැමිය නොහැකිය. ශ්‍රී ලංකාවට තම අභ්‍යන්තර අවස්ථා වැදගත් සේම ඒ රටවලට ඔවුන්ගේ වැසියන් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම වලට අනුව කරන අදහස් වලට සවන්දෙන්නට සිදුවෙයි. මේ අතර ජාත්‍යන්තර සමාජය සමග එකතු වී සිටින ශ්‍රී ලාංකික ''ඩයස්පෝරාව''වැදගත් සාධකයකි. බටහිර රටවල් පුරා විසිරී සිටින සිංහල හා දෙමළ සංවිධාන බටහිර රටවල බලවත් මතයක් දරන අතර විශේෂයෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරව 1980 ගණන් වල සිට ජීවත් වන දෙවන හා තුන්වන පරම්පරාවේ දෙමළ ප්‍රජාව මෙහිදී ඉදිරියෙන් සිටී. කියුබානු විප්ලවය සිදුවන අවස්ථාවේ එරටින් පැන ගිය කියුබානු වැසියන් ඇමරිකාවේ ජීවත්වෙමින් කියුබාවට එරෙහිව බලවේගයක් මතුකළ අතර එම සුළු පිරිස බහුතර මතය අභිබවමින් අද දක්වා ඇමරිකානු කියුබා සබඳතා කෙරෙහි විශාල බලපෑමක් කරයි. මේ අනුව විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයගේ බලය සුළුකොට තැකිය නොහැක.

ත්‍රස්තවාදය තුරන්කර රටක් වශයෙන් නැගී සිටින අවස්ථාවේ ජාත්‍යන්තර සමාජය විසින් මානව හිමිකම්, කම්කරු නීති, පරිසර ආරක්ෂාව, මාධ්‍ය අයිතිය වැනි ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ගැන බලපෑම් කරයි. එය ඔවුන්ගේ පැත්තෙන් සාධාරණ නමුත් අපට දැනෙන්නේ බරපතල අසාධාරණයක් හැටියටය. ගැටුම් පවතින අවධියේ ඔවුන් අවධානය යොමු කළේ ගැටුම ගැන විනා මේ සමාජ අවශ්‍යතා නොවේ. සමාජය යහපාලනයට පෙරුළෙන අවස්ථාවේ උපදෙස් දෙන්නට ඉදිරිපත් වන ජගත් ප්‍රජාවගෙන් රටට ගැලපෙන දේ ලඟාකරගෙන අනවශ්‍ය දේ උපායශීලීව ඉවත් කිරීමට හැකි රාජ්‍යතාන්ත්‍රික භාවයක් අපට අවශ්‍යය. එය විවෘතව කළ නොහැකිය. විශ්වාසය තහවුරු වන අන්දමට හා දෙපාර්ශවයේම ගරුත්වය ආරක්ෂාවන සංවාදශීලී ව්‍යායාමයක් එයට අවශ්‍යය. පුලුල් දර්ශනයක් ඒ වෙනුවෙන් තිබිය යුතුය. ජාත්‍යන්තර ප්‍රජාව සමග කරන ගනුදෙනුව දේශීය දේශපාලන වේදිකාව සමග පටලා ගැනීම වැරදිය. රාජ්‍යතාන්ත්‍රිකව එය පවත්වාගෙන යා යුතුය. දේශපාලන පක්ෂ සහ විවිධ මත දරන සංවිධාන ජාත්‍යන්තර සබඳතා වලදී මැදිහත් කර ගැනීම වැදගත් නැත. එය රටක ප්‍රතිපත්තිය විය යුතුය. ඉන්දියාවේ විපක්ෂය තම රටේ අභ්‍යන්තර ප්‍රශ්න කිසි දිනක ජාත්‍යන්තරයට ගෙන යන්නේ නැත. ආණ්ඩුවත් එසේය. ජාත්‍යන්තර සබඳතා පාවෙන අයිස් කන්දක් සේ සමාජයට පෙනීම සුදුසුය.

අයිස් කන්දේ ජලයෙන් උඩ පාවෙන කොටසට වඩා විශාල ස්ථරයක් දිය යට නොපෙනෙන අන්දමට පවතී. එම නොපෙනෙන කොටස නායකයින් අතර ඇති විශ්වාසය හා ස්ථිරසාරත්වයේ පදනම විය යුතුය. රටවල් හා සංවිධාන වලට විරුද්ධව නැගෙන විවිධ චෝදනා එල්ල වන්නේ දිය මතුපිට ඇති අයිස් කන්දටයි. එහෙත් එයට යටින් ඇති ශක්තිමත් පදනම මහා බලවේගයක්ව පවතින්නේ නම් හා දිය පහර අනුව සුදුසු තැන් බලා ගලා යන්නේ නම් එයට කිසිසේත් හානියක් සිදුනොවේ. හෙන්රි කිංසින්ජර් මහතා වරක් ප්‍රකාශ කළේ '' තම ප්‍රායෝගික පැවැත්මට වැදගත් කුමක්ද? එය කර ගැනීම වැදගත්'' යනුවෙනි.

දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ද අද ලෝකයේ පිළිගැනීමක් ඇති, මතයක් ගෙනයන පාර්ශවයකි. ආණ්ඩු අසමත්වන විට ධනවත් රටවල්, දියුණු වන රටවල මහජනතාව කරා විවිධ ආධාර කෙලින්ම යොමුකරන යාන්ත්‍රණයක් ලෙස රාජ්‍ය නොවන සංවිධාන භාවිතා කරයි. දියුණු බටහිර රටවල ප්‍රදානක ආයතන සමග සමීප සම්බන්ධතා පවත්වන මෙම දේශීය සංවිධාන රටක් ගැන සපයන තොරතුරු, රජය මහත් වෑයමකින් ගොඩනගන කීර්තියට කොඳුනාරටියක් කර ගැනීමට වග බලාගැනීම සාර්ථක විදේශ ප්‍රතිපත්තියක තිබිය යුතු එක කාරණයකි. මෙම සංවිදාන ක්‍රියා කරන්නේ අරමුණක් ඇතිවය. මේ අරමුණ ඉදිරියේ අපට නොගැලපෙන තැන් ඇත්නම් ඒ ගැන සාකච්ඡාකර රාමුවක් සකස් කර ගන්නවා විනා රාජ්‍ය නොවන සංවිධාන හෙලා දකිමින් ඔවුන්ගේ කාර්ය භාරය විනාශ කරන්නට උත්සාහ කිරීම හානිදායකය. වඩා වඩා නිර්මාණශීලීව රටට අවශ්‍ය යුතුකම ඔවුන් ලවා නිරායාසයෙන්ම කර ගැනීම අපගේ වගකීමකි. මෙරට වර්තමාන විදේශ සම්බන්ධතා විමර්ශනය කරන විට ලාංකික ඩයස්පෝරාව හා රාජ්‍ය නොවන සංවිධාන සැලකිල්ලෙන් සම්බන්ධ කර නොගැනීම බලවත් අඩුවකි.

සාමකාමී මාවතක ගමන් කරන ශ්‍රී ලංකාවට අද අවශ්‍යව ඇත්තේ ලෝකයේ රටවල්  වලට එරෙහි යුධ පෙරමුණක් ගොඩ නැගීම නොවේ. ලෝකයේ හැම රටකම තානාපති කාර්යාල පවත්වාගෙනයමින්, සම්පත් හිඟකම නිසා නිසි නඩත්තුවක් ද නැතිව, දක්ෂ නිලධාරීන්ගේ හිඟය නිසා උපායශීලීව රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා පවත්වාගෙන යා නොහැකි නම් මෙම ක්‍රමය වහා සමාලෝචනයකට ලක්කිරීම අවශ්‍යය. සිංගප්පූරුව කරන ආකාරයට අවශ්‍ය රටවලට පමණක් දක්ෂ ආකල්ප අතින් දියුණු හොඳ කාර්ය මණ්ඩලයක් පත් කර ලෝක සිතියමේ අවශ්‍ය තැන් පමණක් දිනා ගැනීමයි. ජී.එස්.පී. ප්ලස් හෝ එක්සත් ජාතීන්ගේ කමිටු වැනි අවස්ථාවලට මුහුණ දිය යුත්තේ ආවේගශීලීව නොවේ. ලෝකය සාධාරණ නැත. කුඩා රටකට එහි බලපෑම වැඩිය. බලවත් රටවල් සිතන්නේ තමන් හැමවිටම සාධාරණව ක්‍රියාකරන බවය. එහි ඇත්තක් නැත. එසේ වෙනවා නම් එක්සත් ජාතීන්ගේ සංවිධානය අවශ්‍ය නැත. එම සංවිධානය බිහිවූයේ කුඩා රටවල් බලවත් ජාතීන්ගේ බලපෑම් වලින් බේරා ගැනීමේ අදහසිනි. එහි නායකත්වයට කුඩා රටක විද්වත් පුද්ගලයෙකු පත්වන්නේ ඒ සමබරතාවය ආරක්ෂා කරගැනීමටය. ප්‍රශ්න ඉදිරියේ හැඟීම්බරවීම අනවශය. ජගත් ප්‍රජාව දිනා ගන්නට උපාය හා දුරදක්නා ක්‍රියාපටිපාටි අපට අවශ්‍යය. අවශ්‍ය දේ ඇඟට ගෙන අනවශ්‍ය දේ නොසලකා හරින්නට අවශ්‍ය ප්‍රායෝගික ඥානය වැදගත්වන්නේ අභියෝග දිනා රට එක්සේසත් කරන තීරණාත්මක අවස්ථාවක බව අමතක කළයුතු නැත.

ශ්‍රී ලංකාව අලුත් යුගයක් කරා අවතීරණ වෙමින් පවතින අවස්ථාවේ බටහිර හෝ වෙනත් සමාජයක බාධා කිරීමක් සිදුවන බව පෙනෙන්නේ නම් එයට එරෙහිව විරෝධය නගන්නට කලින් එවැනි දෙයක් සිදුවන්නට හේතුවූ කරුණ සොයා බැලිය යුතුය. එල්.ටී.ටී. ඊ සංවිධානයට ඉන්දියාවෙන් උදව් ලැබුන බවට ඇති චෝදනාව අලුත් එකක් නොවේ. අතීතයේ පැවති ආණ්ඩු ඉන්දියාව අවබෝධකරගෙන කෙලින්ම සම්බන්ධකම් පවත්වා ගත්තේ නැත. එය දුර්වලකමකි. මේ නිසා විරුද්ධ දේශපාලන හා ත්‍රස්තවාදී සංවිධාන එහි අවස්ථා ප්‍රයෝජනයට ගත්තේය. හිටපු අගමැති රජීව් ගාන්ධි ඝාතනය තෙක් එහි බැරෑරුම් බව අවබෝධකරගත්තේ නැත. ඕනෑම මිතුරෙකු හෝ සතුරෙකු සමග සෘජු ගනුදෙනුවක් සිදු නොවන අවස්ථාවලදී එහි වාසිය අත් කර ගන්නේ දෙපැත්තට පණිවුඩ ගෙනයන අතරමැදියන් බව අවබෝධකර ගැනීම වැදගත්ය. මහින්ද රාජපක්ෂ මහතා ඉන්දියාව මිතුරු කර ගත්තේය. ඇමරිකාව සමග ආරක්ෂක සේවා ගිවිසුමක්

අත්සන් කළේය. ඉන්දියාව සමග සම්බන්ධතා පවත්වන අතර චීනය සමගත් සම්බන්ධකම් වැඩි දියුණු කර ගත්තේය. මැදපෙරදිග රටවල් සමග සුහද වන අතර තුර ඊශ්‍රායලය කිට්ටු කරගත්තේය. අවශ්‍යතාවය එයයි. එහෙත් යුධමය කාලපරිච්ඡේදයේ තිබුණ එම හැකියාව ග්‍රීන් අවධානයෙන් ගිලිහී යා යුතු නැත.

මේ දුබලතා මග හරවාගෙන නව ප්‍රවේශයකට ගමන් කිරීම උදෙසා භාවිතා කළ හැකි නව යාන්ත්‍රණයක්ද අප සතුය. ඒ සියලු සමත්කම් පෙන්වා ඇති ආරක්ෂක හමුදාවයි. විදේශ අමාත්‍යංශයට අමතරව ආරක්ෂක අමාත්‍යාංශය සමග රටවල් අතර සෘජු අවබෝධය ගොඩ නැගෙන ක්‍රම ග්‍රීන් ලෝකයේ බිහිවෙමින් තිබේ. අපේ ආරක්ෂක අමාත්‍යංශය එයට ඇතුළු වී සිටී. ලෝකයේ ප්‍රබලම ත්‍රස්තවාදියා පරාජය කළ යුධ, ගුවන්, නාවික හා සිවිල් සේනාංක වල අත්ද්‍රිකීම් ජගත් ප්‍රජාවට දිය හැකිය. ඕනෑම රටකට අදහස් හා අත්දැකීම් අවශ්‍යය. බටහිර රටවල් සමග හා ආධාර අවශ්‍ය රටවල් සමග සාම හමුදා, ගැලවීමේ සේනාංක හා පුහුණු කරන නිලධාරීන් වශයෙන් අපට සිටින දක්ෂ නිලධාරීන් යවන වැඩ පිළිවෙලක් සාකච්ඡා කරගත හැකිය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම හමුදා සේනාංකයට මෙරට ආරක්ෂක අංශ සම්බන්ධ කළ හැකිය. ඉන්දියාව, පකිස්තානය එසේ කරයි. බංගලා දේශයේ විදේශ ආදායමෙන් සෑහෙන කොටසක් උපයන්නේ එසේය. එය අපේ හමුදාවන්හි විනය හා හැකියාව පෙන්වන අතර රටේ කීර්තිය පතුරවන වැඩ සටහනක් වනු ඇත. මේ සියල්ල සමග ජගත් ප්‍රජාව හා නව සංවාදයක්, ප්‍රතිපත්ති මත මෙහෙයැවෙන ගමනක් ආරම්භ කළහොත් වැඩි කල් ගතවන්නට පෙරාතුව ජාත්‍යන්තර ප්‍රජාව දකින ශ්‍රී ලංකාවේ වත්මන් මුහුණුවර වෙනස් කළ හැකිය.